

# සමානුයෝජනය දරුවාට වැදගත් වන්නේ කෙසේද?

කැළණිය විශ්ව විද්‍යාලයේ සහකාර කථිකාචාර්ය

**නදිරා සරෝජනී ජයතුංග**

පවුල් සංස්ථාවෙන් මෙලොවට බිහිවන කුඩා බිළිඳ තම අවශ්‍යතාවන් මවට දන්වනු ලබන්නේ හැඩීම, සිනාසීම වැනි ක්‍රියාකාරකම් මගිනි. මෙයට ප්‍රතිචාර දක්වන මව කිරිදීම, නැලවීම, උණුසුම් කිරීම තුළින් දරුවා තම මවගේ අන්තර් සබඳතා හොඳින් හඳුනා ගැනීමට උත්සාහ ගනී.

**සමාජීය සත්වයකු ලෙස උපදින දරුවාට සමාජයට අනුකූලව හැඩගැසීමට, සමාජයට අනුකූලව ජීවත්වීමට හුරු කරවන ක්‍රියාවලිය සමානුයෝජනය ලෙස පෙන්වා දිය හැක.**

මෙහිදී දරුවා සමාජයට අළුත් සාමාජිකයෙක් වන අතර ඒ ඒ සමාජවල සිරිත් විරිත් ,ධර්මතා, කතාබහ, ඉගෙනුම් හැසිරීම් මනාව උගත යුතු අතර ඒ සඳහා ප්‍රාථමික සමානුයෝජන ක්‍රියාවලියේදී පවුලේ මව, පියා සහ වැඩිහිටියන් ප්‍රධාන වන අතර ද්විතික සමානුයෝජනයේදී පාසල, මිතුරු සමූහ, ජනමාධ්‍ය ආදිය ප්‍රධාන සමානුයෝජන කාරකයන් ලෙස පෙනී සිටී. මේ අනුව ළමාවිය සමානුයෝජන ක්‍රියාවලියේ මූලික පදනම ලෙස පෙන්වා දිය හැක.

පවුල් සංස්ථාවෙන් මෙලොවට බිහිවන කුඩා බිළිඳ තම අවශ්‍යතාවන් මවට දන්වනු ලබන්නේ හැඩීම , සිනාසීම වැනි ක්‍රියාකාරකම් මගිනි. මෙයට ප්‍රතිචාර දක්වන මව කිරිදීම, නැලවීම, උණුසුම් කිරීම තුළින් දරුවා තම මවගේ අන්තර් සබඳතා හොඳින් හඳුනා ගැනීමට උත්සාහ ගනී. මෙම අවධිය තුළ මව දරුවාට ඇහුම්කන් නොදී ප්‍රතිචාර නොදක්වන කල්හි ළමයා ප්‍රචණ්ඩකාරී හැසිරීම් වලට ආක්‍රමණශීලී ගතිපැවතුම් ඇතිකර ගන්නට ආත්මාර්ථකාමී හැඟීම් වර්ධනය කර ගන්නට උත්සාහ ගන්නා බව පර්යේෂණ වලින් සොයාගෙන ඇත. මේ අනුව දරුවාගේ සමාජ ජීවිතයේ මූලික පදනම නිර්මාණය කරදෙනු ලබන්නේ මව විසිනි. නිසි පරිදි කිරිදීම, කැම කැවීම, නැවීම, වැසිකිළි පුහුණුව, දරුවා සුරතල් කිරීම, නැලවිලි ගීත ගායනා කිරීම, කතන්දර කියාදීම, ආදී ක්‍රියාකාරකම් දරුවාට කුඩා අවධියේ පටන් පුහුණු කිරීම තුළින් දරුවා සමාජයට අනුගතවීමට , සමාජයේ සෙසු අය සමග හොඳින් අන්තර් සබඳතා පැවැත්වීමට උත්සාහ ගනු ලැබේ. දරුවාගේ අවශ්‍යතාවන් මව , පියා විසින් හොඳින් අවබෝධ කරගත යුතු අතර ඒ තුළින් පසු කාලයේ දරුවා සමාජයේ සෙසු සාමාජිකයන් සමඟ සාමකාමී ලෙස අන්තර් සබඳතා පැවැත්වීමට රුචියක් දක්වනු ලැබේ. උදහරණ ලෙස දරුවා ක්‍රමයෙන් වර්ධනය වත්ම අන් අයට ගරු සැලකිලි දක්වන්න, කැමක් බෙදගෙන කන්න, ක්‍රීඩාවකදී සුහදව අන් අය සමඟ ක්‍රීඩා කරන්න. මිත්‍රශීලීව සම්බන්ධතා පවත්වන්නට දරුවා ලැබූ ප්‍රාථමික සමානුයෝජනය Primary Socializationඉතා වැදගත්වේ.

දෙවනුව දරුවාට වැදගත් වන්නේ ද්විතික සමානුයෝජන කාරකයන් වන පාසල, මිතුරු සමූහ, ජනමාධ්‍ය,වැනි දේ මගින් පවුල් සංස්ථාවෙන් ලබාගත් දැනුම අවබෝධය තමා විසින් හොඳ හෝ නරක යයි විනිශ්චය කර ඒ අනුව ක්‍රියා කිරීමට උත්සාහ ගනු ලැබීමයි. පාසල මගින් දැනුම, අවබෝධය,පුහුණුව ලබාගැනීමට ගුරුවරුන් ප්‍රධාන වශයෙන් උදව්වන අතර ඒ තුළින් හොඳ නරක තෝරා බේරා ගැනීමට දරුවාට හැකිවනු ලැබේ. එසේම තම සම වයස් කාණ්ඩවලට එකතුවීමට දරුවා මහත් රුචියක් දක්වන අතර ඒ තුළින් ඔවුන්ගේ සාමූහිකත්වය පොදු ගැටළු සාකච්ඡා කිරීම, එකමුතුව වැඩකටයුතු සහ ක්‍රීඩා කිරීමට කැමත්තක් දැක්වීම , අන් අයට ඇහුම්කන්දීමට පුරුදුවීම, ගරු සැලකිලි දැක්වීමට ඉගෙන ගනු ලැබේ. එසේම ළමයා ජනමාධ්‍ය මගින් ද යම් යම් දේ ඉගෙන ගෙන ඒ අනුව කටයුතු කිරීමට ද උත්සාහ ගනු ලැබේ. මෙහිදී රූපවාහිනිය (අන්තර්ජාලය) පරිගණක යන්ත්‍ර දරුවාගේ ප්‍රධාන මෙවලම් බවට වර්තමානය වනවිට පත්වී අවසානය. මෙහිදී දරුවා සම වසස් කාණ්ඩවලට සහ ජනමාධ්‍ය

27 පිටුවට

## සමානුයෝජනය ... 2 පිටුවෙන්

වලට පුරුදුවීම තුළ යහපත් මෙන්ම අයහපත් දේවල් වලටද යොමුවන බව වර්තමාන සමාජය දෙස බැලීමේදී අවබෝධ කරගත හැක.

මේ අනුව සමස්තයක් වශයෙන් සමානුයෝජනය සහ දරුවා අතර පවතින සම්බන්ධතාවය ගත්විට බිළිඳකු වශයෙන් මෙලොව උපත ලැබීමෙන් පසුව තම සමාජයේ පවතින ධර්මතා, අගනාකම්, නීතිරීති, භාෂාව, චාරිත්‍ර වාරිත්‍ර සහ සියළු සංස්කෘතික අංගයන් මේ මගින් ඉගෙන ගනු ලැබේ. පොදු බව ආරක්ෂාකර ගැනීම තම හැකියාවන් වර්ධනය කර ගත යුතු ආකාරයන් සමාජයෙන් ලැබෙන විවිධ තත්ත්වයන් සහ ඊට හිමිවන කාර්ය කොටස් ඝට්ටනයකින් තොරව පවත්වා ගෙන යාමත් යුතුකම් වගකීම් පිළිබඳ නිසි අවබෝධයක් ලබාගැනීමට මෙය උපකාරීවේ. උදහරණයක් ලෙස කුඩා දරුවා තම වැඩිහිටියන් අනුකරණය කිරීමට මහත් රුචියක් දක්වනු ලැබේ. ගැහැනු දරුවකු තම මවමෙන් බෝනික්කකු ගෙන යම් යම් දේ අනුකරණය කිරීමත්, පිරිමි දරුවකු තුවක්කු , පිස්තෝල , වාහන ආදිය ගෙන පියාගේ භූමිකා රඟ දැක්වීම ආදිය තුළින් අවබෝධ වන්නේ දරුවා කුඩා කල සිටම එකිනෙක .කාර්යයේ කොටස් පිළිබඳ අවබෝධයක් ලබාගන්නේ තම වැඩිහිටියන් අනුගමනය කිරීමෙන් බවයි.

මෙසේ දරුවා සංස්කෘතිය පිළිබඳ දැනීමක් ලබාගන්නා අතරම ඒ මගින් පෞරුෂත්ව වර්ධනයක්ද සිදුවන බව පෙනේ. කුඩා කල පටන් මානසික අවශ්‍යතාවන් සංසිඳවා ගැනීමට නුපුළුවන් වූ ළමයා නොයෙක් මානසික පෙළඹවීම්වලට යටත් වන අතර ඉක්මන් කෝපය , අන් අය සමඟ සහයෝගී ලෙස කටයුතු කිරීමට ඇති අකමැත්ත සමාජයෙන් ඈත්ව හුදෙකලාවීම ආදී ක්‍රියාකාරකම් දැකිය හැක. මෙයට හොඳම නිදසුනක් ලෙස මාග්‍රට් මීඩ් නම් මානව විද්‍යාඥවරිය නිව්ගිනියා දූපත් වල කළ අධ්‍යයනය තුළින් පෙන්වා දෙනු ලැබුවේ ඇරපේෂ් ගෝත්‍රික දරුවන් ඉතාමත් සාමකාමී සහයෝගීත්වය අගය කරන්නන් වූ අතර මුන්ඩු ගුමාර් ගෝත්‍රික දරුවන් ඉතාමත් ආක්‍රමණශීලී වූවන් බවයි. දරුවන්ට කුඩා කල නිසි ආදරය, ආරක්ෂාව, සැලකීම, නිසි වෙලාවට මව්කිරිදීම, වැනි කාරණා සිදු නොවන කළ මාතෘ විභාකරණයට (Materril Deprivation) එනම් මව පියාගේ නිසි ආදරය නොලැබීයාමට භාජනය වන බව ජෝන් බොල්බි නම් මනෝවිද්‍යාඥයා පෙන්වා දි ඇත. මෙම ලක්ෂණය බොහෝ කොට අනාථ නිවාස වල වැඩෙන දරුවන්ගෙන් මනාව දැකිය හැකිවේ. ළමයින් බාල වයසේදීම නීති විරෝධී, සමාජ විරෝධී ක්‍රියා වලට පෙලඹීමට එක් හේතුවක් වන්නේ ඔවුන්ගේ දෙමාපියන් සහ ඔවුන් අතර අන්‍යොන්‍ය සම්බන්ධතාවයේ ඇති දූර්වලත්වය නිසා බව බාල අපචාරී ළමයි පිළිබඳ කරන ලද අධ්‍යයනයකින් පෙන්වා දි ඇත.

කුඩා අවධියේ පටන් දරුවන් දෙමාපියන්, පවුලේ වැඩිහිටියන් අනුකරණය කරති. එමනිසා කුඩා අවදියේ දී දෙමව්පියන් විසින් දෙනු ලබන පුහුණුව පුද්ගලයාගේ පෞරුෂත්වය ගොඩනැගීමට බෙහෙවින් බලපාන බව සමාජ හා මනෝ විද්‍යාඥයන් පෙන්වා දි ඇත. මේ අනුව පැහැදිලි වන්නේ සමානුයෝජන ක්‍රියාවලිය නිසි පරිදි සිදු නොවුන හොත් පසු කාලයේ දරුවා පෞරුෂ අඩුපාඩු වලින් යුක්ත වන බවයි. එසේම දරුවා නිසි පරිදි සමාජයට හැඩගැසීම තුළින් යහපත් දරුවකු බිහිවන අතර එය ඉටු නොවන කල්හි අපචාරී, සමාජයට වැඩදායි නොවන දරුවකු නිර්මාණය වනු ලැබේ. මේ අනුව යහපත් සහ අයහපත් දරුවන් දෙදෙනාම නිර්මාණය කිරීමට දෙමව්පියන්ගේ ප්‍රාථමික සමානුයෝජනය ඍජුව බලපාන බව කිවයුතුවේ.

ළමා සංවර්ධනයත් මනා පෞරුෂත්වයත් ගොඩනැංවීමෙහිලා ප්‍රාථමික සහ ද්විතික සමානුයෝජනකාරකයන්ගේ මඟ පෙන්වීම ඍජුව බලපාන බැවින් යහපත් දරුවන් පිරිසක් ලොවට බිහිකරන්නට හොඳ මග පෙන්වීමත්, දයකත්වයත් සියළු වැඩිහිටියන් තුළ තිබිය යුතු මානුෂික ගුණාංගයන් ලෙස කිවයුතුවේ. ❑